සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **ඉතිහාසය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3) සහ (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් වන දකුණු ඉන්දියාවේ දී රචිත ග්‍රන්ථයක් වන්නේ,
    (1) යාල්පාන වෛපමාලෛ (2) ශෛගරාසශේකරමාලෛ
    (3) මණිමේකලයි (4) කෛලායමාලෛ

02. අපේ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කෙරෙන ජීවමාන සාක්ෂි ලෙස ගත හැක්කේ,
    (1) නටබුන් ය. (2) චිත්‍ර මූර්ති කැටයම් ය.
    (3) පුරාවස්තු ය. (4) කාසි ය.

03. මැටිඔරු සුසානවල පැරණි බව ස්ථිර කරන ප්‍රබල සාක්ෂියකි.
    (1) ගල්මෙවලම් බහුලව තැන්පත් කර තිබීම.
    (2) මිනිස් භෂ්මාවශේෂ තැන්පත් කිරීම.
    (3) ඔවුන් විසින් පරිහරණය කරන ලද භාණ්ඩ කොටස් තැන්පත් කිරීම.
    (4) මිනිස් ඇටසැකිලි තැන්පත් කර තිබීම.

04. ඓතිහාසික මූලාශ්‍රවල ධීවරයන් විසූ ගම් හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
    (1) කසීකාරගාම (2) පට්ටනගාම (3) කේවට්ට ගාම (4) නියම්ගම්

05. පැරණි කාලයේ කුල යන පදයෙන් අදහස් වූයේ,
    (1) කුලයයි. (2) පවුලයි. (3) ගමික යි. (4) ගෘහපති යි.

06. සමස්ත ලෝකයටම අධිපති යන සංකල්පය භාවිත කළ රජ වූයේ,
    (1) කුටකණ්ණාභය (2) මහසෙන් (3) I කාශ්‍යප (4) නිශ්ශංකමල්ල

07. I විජයබාහු රජු පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට බලපෑ වැදගත්ම සාධකය වූයේ,
    (1) චෝල පාලනය නිසා අනුරාධපුරය විනාශයට පත්ව තිබීම යි.
    (2) අනුරාධපුරයට වඩා පොළොන්නරුව සශ්‍රීක ප්‍රදේශයක් වීමයි.
    (3) ඉන්දියානු සාගරයේ බටහිර ප්‍රදේශ මූලික කොට පැවති අන්තර්ජාතික වෙළඳාම් නැගෙනහිර ඉන්දියානු සාගර කලාපයට මාරු වීම යි.
    (4) අනුරාධපුරයට වඩා පොළොන්නරුව ආරක්ෂිත ස්ථානයක් වීම යි.

08. පැරණි රජවරුන් ජනතාව දැනුවත් කිරීම උදෙසා පනවන ලද නීති ඇතුළත් සෙල් ලිපි කිහිපයක් I තීරුවේ ද ඒවා ලියවන ලද රජවරු II තීරුවේ ද සඳහන් වේ. I තීරුවේ අනුපිළිවෙළට II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1 | වේවැල්කැටිය සෙල්ලිපිය | A | IV උදය |
| 2 | බදුලු ටැම් ලිපිය | B | III උදය |
| 3 | කොණ්ඩවට්ටවාන් | C | IV මිහිඳු |
| | | D | V කාශ්‍යප |

(1) A C B (2) B A D (3) C A D (4) C B A

09. අතීතයේ බර මැනීම සඳහා භාවිතා කළ මිනුම් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) අක හා ධරණ (2) ගුන්ජා හා තජ්ජාරි
(3) ස්වර්ණ හා කරිස (4) ආංගුල හා මාසක

10. අතීත ශ්‍රී ලංකාවේ 'අචල ජල විද්‍යාව' යන මූලධර්මය ප්‍රකට වන අවස්ථාවක් වන්නේ,
(1) රුවන්වැලි සෑයේ අත්තිවාරමෙනි.
(2) අතීත වාරි තාක්ෂණයෙනි.
(3) රුවන්වැලි සෑයට සවිකර ඇති වජ්‍ර චුම්බටයෙනි.
(4) දැදිගම ඇත් පහණෙනි.

11. දෙමව්පිත් විසින් තමන්ගේ දියණිය සූප ශාස්ත්‍රයෙහි නිපුණ කරවීම ඔවුන් සතු වගකීමක් බව දැක්වෙන කෘතිය වන්නේ,
(1) දම්පියා අටුවා ගැටපදයේ ය. (2) සහස්සවත්ථුපකරණයේ ය.
(3) සද්ධර්මාලංකාරයේ ය. (4) රසවාහිනියේ ය.

12. පරුමක වරයෙකුට නායක පදවිය හිමිවීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,
(1) ප්‍රදේශයක පාලන බලය හිමි වීම ය.
(2) වැව් පද්ධතියක් පාලනය කිරීමේ බලය හිමි වීම ය.
(3) ගම්කයන් අතර ප්‍රධානත්වය හිමි වීම ය.
(4) ආර්ථික වශයෙන් සමෘද්ධි පුද්ගලයෙකු වීම ය.

13. දෙවන නාගරිකරණ යුගයේ බිහි වූ රාජධානි සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
(1) නව වරායවල් වර්ධනය වීමයි.
(2) සාහිත්‍යයේ කැපී පෙනෙන පුනර්ජවනයක් ඇති වීමයි.
(3) නගර ආකෘතිය නිදහස් ස්වරූපයක් ගැනීමයි.
(4) පරිමාණය අතින් විශාල වීමයි.

14. ලංකාවේ රාජධානි තෙත් කලාපයට මාරු වීමෙන් පසු නැවත රජරට රාජධානියේ කෙටි කාලයක් පාලන කටයුතු මෙහෙය වූ රජ වන්නේ,
(1) තෙවන පරාක්‍රමබාහු (2) දෙවන බුවනෙක බාහු
(3) දෙවන පරාක්‍රමබාහු (4) පළවන බුවනෙක බාහු

15. III විජයබාහු රජු මුල දී වන්නි නායකයකු ලෙස කටයුතු කළ බව දැක්වෙන කෘතිය වන්නේ කුමක් ද?
(1) රාජාවලිය (2) පූජාවලිය (3) රසවාහිනිය (4) කඳවුරු සිරිත

16. පහත A, B, C, D යන ප්‍රකාශ අතුරෙන් පළමුවන විමලධර්මසූරිය රජතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
A සියම් දේශයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්වීම.
B උඩරට නව රාජවංශයක ආරම්භක පාලකයා වීම.
C පෘතුගීසින් මෙරටින් පලවා හැරීම.
D මුල්වරට මෙරටට ලන්දේසි දූතයකු පැමිණීම.
(1) A හා C (2) B හා C (3) B හා D (4) C හා D

17. පහත දක්වෙන සිදුවීම් නිවැරදි අනුපිළිවෙළට සැකසූ විට නිවැරදි පිළිතුර වන්නේ,
   A ඉංග්‍රීසින් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගැනීම
   B පස්යොදුන් රට සිංහල සංගෙ නමින් කැරැල්ල ඇති වීම.
   C ඉබන් බතුතා මෙරටට පැමිණීම.
   D ජෝන් ෆයිබස් නම් ඉංග්‍රීසි දූතයා උඩරටට පැමිණීම.
   (1) B A C D (2) C B D A (3) C D B A (4) D B C A

18. උඩරට රාජධානියේ රදල ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් පිරිනමන ලද ඉඩම් හැඳින්වෙන නම කුමක් ද?
   (1) නින්දගම් (2) ගබඩාගම් (3) පරවේණි (4) ඔලගම්

19. පුනරුද සමයේ ඉතා පුලුල් වෙනසකට ලක් වූයේ,
   (1) ප්‍රතිමා ය. (2) ගෘහ නිර්මාණ ය. (3) සාහිත්‍ය ය. (4) චිත්‍ර ය.

20. I තීරුවේ දැක්වෙන තොරතුරු හා II තීරුවේ තොරතුරු නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1 | නිකලස් කොපර්නිකස් | A | මුද්‍රණ යන්ත්‍රය |
| 2 | ක්‍රිස්ටෝපර් කොලොම්බස් | B | පෘථිවිය ගෝලාකාර බව |
| 3 | ජොහැන්ස් ගැටෙන්බර්ග් | C | කුණාටු තුඩුව |
| 4 | බර්තොලමියුඩයස් | D | බටහිර ඉන්දිය දූපත් |

   (1) A C B D (2) B D A C (3) C B A D (4) D B A C

21. ''සෙයිලන්'' යන නමින් ලංකාව හඳුන්වන ලද විදේශීය ජාතිය වන්නේ,
   (1) පෘතුග්‍රීසින් ය. (2) ලන්දේසින් ය. (3) ඉංග්‍රීසින් ය. (4) අරාබින් ය.

22. සීතාවක මායාදුන්න රජු සමග සන්ධානයකට පැමිණි යාපනයේ පාලකයා වන්නේ,
   (1) පරරාජසේකරම්ය. (2) විජය කුලංකෛය (3) සංකිලිය. (4) එදිරිමානසිංහම්ය.

23. ලන්දේසින් සමඟ ගිවිසුම්වලට එළඹුණ උඩරට රජවරුන් දෙදෙනා වන්නේ,
   (1) I විමලධර්මසූරිය හා කීර්ති ශ්‍රී රාජසිංහ රජු (2) II රාජසිංහ රජු හා ශ්‍රී විජය රාජසිංහ රජු
   (3) I රාජසිංහ රජු කීර්ති ශ්‍රී රාජසිංහ රජුය. (4) II රාජසිංහ රජු හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුය.

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් 24 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
   A දුම්රිය එන්ජිම B රොලර් යන්ත්‍රය C විවෘත උදුන් ක්‍රමය
   D වාෂ්ප එන්ජිම E ආරක්ෂක ලාම්පුව

24. කාර්මික විප්ලව සමයේ ගල් අඟුරු කර්මාන්තය හා සම්බන්ධ සොයා ගැනීම් ඇතුළත් අක්ෂර වන්නේ,
   (1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) D හා E ය.

25. යකඩ හා වානේ කර්මාන්තය හා සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වන්නේ,
   (1) A හා B ය. (2) B හා C ය. (3) C හා E ය. (4) D හා E ය.

26. පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට ආසියාවේ වෙළඳ කටයුතුවලට අවසර හිමිවීමත් සමඟ පළමු නැව් කණ්ඩායම පැමිණෙන ලද්දේ,
   (1) ඇම්බොයිනාවට ය. (2) ඉන්දියාවට ය. (3) සුමාත්‍රාවට ය. (4) ශ්‍රී ලංකාවට ය.

27. ''කිව් ලිපිය'' එවන විට මෙරට මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ ආණ්ඩුකාරවරයා වූයේ කවු ද?
   (1) පෙඩ්රික් නෝර්ත් ය. (2) තෝමස් මෙට්ලන්ඩ් ය.
   (3) රොබට් බ්‍රවුන්රිග් ය. (4) ෆන් එංගල්බෙක් ය.

28. ජෝන් ඩොයිලි සිංහල භාෂාව ඉගෙනීමේ කටයුතුවල නිරත වූයේ කුමන භික්ෂූන් වහන්සේ යටතේ ද?
   (1) කරතොට ධම්මාරාම හිමි (2) වලානේ සිද්ධාර්ථ හිමි
   (3) හික්කඩුවේ සුමංගල හිමි (4) සංඝරක්ඛිත මා හිමි

29. 1848 නිදහස් සටනට හේතු වූ බදු වර්ගයක් නොවන්නේ,
(1) ඇග බද්ද (2) දුම්කොළ බද්ද (3) වෙළඳසැල් බද්ද (4) ඔරුපාරු බද්ද

30. මදුරාසි පාලනය යටතේ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනයට පත්කර එවන ලද්දේ,
(1) ආණ්ඩුකාරවරයෙකි. (2) කලෙක්ටර්වරයෙකි. (3) රෙසිඩන්ට්වරයෙකි. (4) අවුමිල්දාර්වරයෙකි.

31. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීමට මූලිකත්වය ගනු ලැබූ ස්වාමීන් වහන්සේ කවුද?
(1) රත්මලානේ ධම්මාලෝක හිමි (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
(3) වලානේ සිද්ධාර්ථ හිමි (4) බුලත්ගම ධම්මාලංකාර සිරිසුමන තිස්ස හිමි

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් 32 හා 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  - A - සීමිත ඡන්ද බලය හඳුන්වා දීම.
  - B - නිලනොලත් සාමාජික පිරිස බහුතරය වීම.
  - C - රාජ්‍ය මන්ත්‍රණසභාව හඳුන්වා දීම.
  - D - පළාත් බද නියෝජනය හඳුන්වා දීම.
  - E - ව්‍යවස්ථාදායක සභාවට ශ්‍රී ලංකිකයකු මුල්වරට ඡන්ද බලයෙන් පත්වීම.

32. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අදාළ අක්ෂර දෙක කුමක් ද?
(1) A හා C (2) B හා D (3) C හා D (4) D හා E

33. කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ දී සිදු වූ වෙනස්කම් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා C (2) C හා D (3) A හා E (4) D හාඩි

A - මුත්තුසාමි කුමරා රජු ලෙස ප්‍රකාශ කිරීම
B - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මීමුරේ ප්‍රදේශයට පලායාම

34. 1803 උඩරට ආක්‍රමණය අවස්ථාවේදී,
(1) A හා B අසත්‍ය වේ. (2) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(3) A අසත්‍ය වන අතර B සත්‍ය වේ. (4) A හා B දෙකම අසත්‍ය වේ.

35. 1818 පළමු නිදහස් අරගලයට සහය නොදුන් උඩරට රදල ප්‍රධානින් දෙදෙනා වන්නේ කවුද?
(1) මොල්ලිගොඩ හා කැප්පිටිපොල (2) ඇහැලේපොළ හා මඩුගල්ලේ
(3) පිළිමතලව්වේ හා මොල්ලිගොඩ (4) මොල්ලිගොඩ හා එක්නැලිගොඩ

36. 1818 සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ,
(1) වෙල්ලස්ස (2) කුරුණෑගල (3) මහනුවර (4) මාතලේ

- **පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රකාශ යුගලයෙහි පළමු වැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර 37 සිට 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. 1. අනිවාර්ය සේවා රාජකාරි ශ්‍රම ක්‍රමය
   2. ගම් සභාව

B. 1. පොපි මල් ව්‍යාපාරය
   2. නිදහස සඳහා දායක වීම.

C. 1. ලෝක ආර්ථික පරිහානිය
   2. කෝපි වගාව

D. 1. පුනරුදය
   2. බටහිර අධ්‍යාපනය මෙරට ප්‍රචලිත වීම

37. දෙවැන්න කෙරෙහි පළමුවැන්න අයහපත් ලෙස බලපා ඇති යුගලය වන්නේ කුමක් ද?
(1) A (2) B (3) C (4) D

38. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් නොදක්වන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්නෙහි ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න සිදු වූ බව දැක්වෙන,
(1) A (2) B (3) C (4) D

40. මුල් කාලයේ දේශපාලන පක්ෂ දෙකක් පමණක් දැකිය හැකි වූ යුරෝපා රට කුමක් ද?
(1) ඇමෙරිකාව (2) එංගලන්තය (3) ප්‍රංශය (4) ජර්මනිය

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - II | කාලය පැය 03 යි. මිනිත්තු 10 යි. |
|---|---|---|

නම/ විභාග අංකයඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 4 ක් ද, **III** කොටසින් ප්‍රශ්න එකක් ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.
- අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.
(අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

---

## I - කොටස

(01) (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

ගල් ඔය, දැදුරු ඔය, යෝධ වැව, සොරබොර වැව, අනුරාධපුරය, ගාලුවරාය, කත්තරෝඩය, මඩකලපුව, මාතලේ, ඉරණමඩු, කොළඹ, පෙඩ්රික් කොටුව (ලකුණු 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

කල්කටා, වතිකානුව, අරාබි මුහුද, කොරියානු අර්ධද්වීපය, ප්‍රංශය, මලක්කා සමුද්‍ර සන්ධිය

(ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A කාම්බෝජවරු නමින් හැඳින් වූ වෙළඳ කණ්ඩායම් පැමිණි රට

B අතීතයේ රෝගින් සඳහා සකස් කළ උළුකැඳ හැඳින්වීමට භාවිත කළ අනෙක් නම

C මුද්‍රණ කර්මාන්තය මෙරටට හඳුන්වා දෙන ලද විදේශීය ජාතිය

D ලංකා සංගමය පිහිටවමින් යුරෝපීය උද්ඝෝෂණවල නායකත්වය දුන් පුද්ගලයා

(ලකුණු 04 යි)

- **A** සහ **B** යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.


(ii) (1) A පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?

(2) මෙය ඉදිකොට ඇත්තේ කුමන ඔය හරහා ද?

(3) මෙය දක්නට ලැබෙන දිස්ත්‍රික්කය කුමක් ද?

(4) මෙයින් පැහැදිලි තාක්ෂණික ක්ෂේත්‍රය කුමක් ද?

A



(ලකුණු 04 යි)

B



(iii) (1) B රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවිද?

(2) ඔහු පාලනය කළ රට කුමක් ද?

(3) ප්‍රංශ විප්ලවයෙන් පසු ඔහු රැකවරණය පතා පලා ගිය රට කුමක් ද?

(4) ඔහු විසින් එවකට ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාරයා වෙත එවන ලද ලිපිය හැඳින්වූ නම කුමක් ද?

(ලකුණු 04 යි)

## II - කොටස

(02) (i) දීපවංසය හා මහාවංශය රචනා කිරීමේ දී ආභාෂය ලබාගත් ග්‍රන්ථ තුනක් ලියන්න. (ලකුණු 03 යි)

(ii) පහත A සිට D දක්වා ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ඉන්ඩිකා කෘතියේ කතුවරයා

B - I විජයබාහු රජු විසින් කරවන ලද සන්නස

C - සකස්කර ගත් ගල් කුලුණු මත ලියූ ලිපි හැඳින් වූ නම

D - පොළොන්නරු රාජ්‍ය සමයේ භාවිත වූ කාසි විශේෂය (ලකුණු 04 යි)

(iii) ලංකා ඉතිහාසය ගොඩනැගීමේ දී මහාවංශය වැදගත් වන ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ඉතිහාසය ගොඩනැගීමට පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වැදගත් වන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(03) (i) ගල් යුගයේ මානවයින් පිෂ්ඨය ලබා ගැනීම සඳහා භාවිත කළ ශාකමය ආහාර තුනක් නම් කරන්න.

(ලකුණු 03 යි)

(ii) පූර්ව ඓතිහාසික යුගයේ භාවිත වූ මහාශිලා සුසාන අයත් සාධක හමු වූ ස්ථාන හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක දෙකක් දක්වා ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණයේ දියුණුව කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

(04) (i) මහවැලි තැනීමේ අරමුණු තුනක් ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) පරුමකවරුන්ගේ කාර්යභාරයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) අතීතයේ පාලන කළ රජවරු අසල්වැසි රාජ්‍ය සමඟ සුහද සබඳතා පැවැත් වූ බව රජවරු දෙදෙනකුගේ ක්‍රියාකාරකම් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සංවිධානය වී තිබූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(05) (i) පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ රාජධානි තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) සීතාවක රාජධානියේ බිඳ වැටීමට හේතු වූ කරුණු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පෘතුගීසීන්ට කෝට්ටේ රාජධානියේ බලය අත්පත්කර ගැනීමට පහසු වීමට බලපෑ හේතු දෙකක් දක්වා ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට උඩරට රාජධානිය අත්පත් කර ගැනීම නොහැකි වීමට බලපෑ හේතු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(06) (i) ඉංග්‍රීසින් ලංකාවේ මුහුදුබඩ බලය අත්පත් කර ගැනීමට පෙර මෙරටට එවන ලද දූතයන් තිදෙනා කව්ද? (ලකුණු 03 යි)

(ii) මියුරන් කොමිසම මගින් ගෙනඑන ලද නිර්දේශ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) උඩරට කෙරෙහි ඉංග්‍රීසින්ගේ අවධානය යොමු වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) 1848 නිදහස් අරගලයට කෝල්බෲක් ප්‍රතිසංස්කරණයේ බලපෑම සිදුවූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(07) (i) ශ්‍රී ලංකාව ආගම් ප්‍රචාරය සඳහා පැමිණි මිෂනාරි කණ්ඩායම් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරයේ නියැලුණු සර් ජේම්ස් පීරිස් මහතා ප්‍රමුඛ පිරිස ඉල්ලා සිටි ප්‍රධාන ඉල්ලීම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මගින් මෙරටට දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරටට උරුම වූ හිතකර බලපෑම් දෙකක් හා අහිතකර බලපෑම් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

## III කොටස

(08) (i) දොලොස්වන සියවසෙන් පසු යුරෝපයේ ආරම්භ වූ අධ්‍යාපන මධ්‍යස්ථානවල ඉගැන්වූ මානවවාදී විෂයන් තුනක් ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) නව මුහුදු මාර්ග සොයා යෑමේ ගමන සාර්ථක වීම කෙරෙහි බලපෑ සාධක දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පුනරුදය නිසා ලෝකයේ දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පුනරුදය ඇති වීමට බලපෑ හේතු තුනක් දක්වා ඒ පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(09) (i) කාර්මික විප්ලවය සමයේ පේෂ කර්මාන්තය දියුණු කිරීම සඳහා හඳුන්වා දුන් නව උපකරණ තුනක් ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) පහත A සිට D දක්වා ඇති නව සොයා ගැනීම් කළ පුද්ගලයින් වරහන් තුළින් තෝරා ලියා දක්වන්න.

A දුම්නැව

B විදුලි පණිවිඩ ක්‍රමය

C අශ්වයින් බඳින ලද නගුල් වලින් පේළියට වැපිරීමේ ක්‍රමය

D බැටලු වර්ග අභිජනනය ආශ්‍රිත සොයා ගැනීම්

(ඇලෙක්සැන්ඩර් ග්‍රැහම් බෙල්, රොබට් බැක්වෙල්, ජෙත් රෝටර්, සැමුවෙල් මෝස් , හෙන්රි බෙල්)

(ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවය සමාජ ක්ෂේත්‍රයට ඇති කළ බලපෑම කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවය ශ්‍රී ලංකාවේ පහත සඳහන් ක්ෂේත්‍රවලට කරන ලද බලපෑම උදාහරණ මගින් පැහැදිලි කරන්න.

* කර්මාන්ත
* ප්‍රවාහන
* සන්නිවේදන (ලකුණු 06 යි)

(01) (අ) (i)
(01) (*a*) (i)
(01) (*அ*) (i)



(01) (ඇ) (ii)
(01) (a) (ii)
(01) (அ) (ii)




## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(1) | 4 -(3) | 5 -(2) | 6 -(4) | 7 -(3) | 8 -(3) | 9 -(1) | 10 -(4) |
| 11-(2) | 12-(4) | 13-(4) | 14-(1) | 15-(2) | 16-(3) | 17-(2) | 18-(1) | 19-(4) | 20-(2) |
| 21-(1) | 22-(3) | 23-(4) | 24-(4) | 25-(2) | 26-(3) | 27-(4) | 28-(1) | 29-(2) | 30-(1) |
| 31-(1) | 32-(2) | 33-(3) | 34-(1) | 35-(4) | 36-(1) | 37-(3) | 38-(2) | 39-(4) | 40-(4) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) (i)




(ii)




(ආ) (i) A - ඇෆ්ගනිස්ථානය B - යවාගු

C - ලන්දේසි D - ජෝර්ජ් වෝල්

(ii) (1) ගල්පාලම (2) මල්වතු ඔය

(3) අනුරාධපුරය (4) පාලම් තැනීමේ මූලික සිද්ධාන්ත දැන සිටි බව

(iii) (1) V විලියම් රජු (2) ඕලන්දය

(3) බ්‍රිතාන්‍යය (4) කිව් ලිපිය

## II කොටස

(02) (i) සීහලට්ඨ කථා මහාවංශය උත්තර විහාරට්ඨ කථා විනයට්ඨ කථා

(ii) A - මෙගස්තිනිස් B - පනාකඩුව තඹ සන්නස

C - ටැම් ලිපි D - තඹ මස්ස

(iii) අඛණ්ඩව තොරතුරු සඳහන් වීම.

මහාවංශයේ පළමු කොටස බුදුන් වහන්සේගේ ලංකාගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමය අවසානය දක්වා තොරතුරු ඇතුළත් වේ. ඉන්පසු පොළොන්නරු යුගයේ දී එතැන් සිට චූලවංශය ලෙසත් පසුකාලීනව නව සෑම රාජධානියකදීම මහාවංශයේ කොටස් රචනා වී ඇත. වසර 2500 ක අඛණ්ඩ ඉතිහාසය වර්තමානය දක්වාම මහා වංශයේ සඳහන් වීම නිසා ඉතිහාසය ගොඩනැගීමේ දී වැදගත් කෘතියක් ලෙස ගත හැක.

විශ්වාසනීය කෘතියක් වීම

මහා වංශය රචනා කිරීම සඳහා ඊට පෙර ලියවුන දීපවංශය සීහලට්ඨකථා මහා වංශය උත්තර විහාරට්ඨ කථා, විනයට්ඨ කථා යන ග්‍රන්ථ උපයෝගී කර ගැනීම නිසා එහි විශ්වාසනීය බව තහවුරු වේ. එමෙන් ම මහා වංශයේ සඳහන් තොරතුරු සෙල් ලිපි ආදියෙන් සනාථ වීම මගිනුත් විශ්වාස නිසා බව තවදුරටත් තහවුරු වේ.

උදා : මහාවංශයේ සඳහන් දසමහායෝධයන් පිළිබඳ තොරතුරු සිතුල්පව්ව විහාර හා සංඛපාල විහාර ලිපියෙන් සනාථ වේ.

(iv) * වඩා විශ්වාස තොරතුරු ලබාගත හැකි වීම.

පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර බොහෝ විට ඓතිහාසික සිදුවීම්වලට සමකාලීනව සිදුවේ. එම නිසා සාහිත්‍ය මූලාශ්‍රවල තොරතුරු පුරාවිද්‍යාත්මක වශයෙන් සනාථ වේ නම් ඒවා වඩා විශ්වාසදායි තොරතුරු ලෙස පිළිගත හැකිවේ. එමෙන්ම සාහිත්‍ය මූලාශ්‍ර මෙන් පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර කතුවරුන්ගේ රුචි අරුචිකම් මත නිර්මාණය වීම සිදුවන්නේ ඉතා අල්ප වශයෙනි.

* සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් නොවන තොරතුරු ලබා ගැනීම පුරා විද්‍යාත්මක මූලාශ්‍ර වන සෙල්ලිපි මගින් විහාරාම පාලනය, ගම්බිම් පිදවීම, බදු අය කිරීම, පුද්ගලයන්ගේ සේවය ඇගයීම වැනි කරුණු ලබා ගත හැක. එමෙන් ම නටබුන්, පුරාවස්තු මගින් පුද්ගලයන්ගේ ශිල්පීය දක්ෂතාව, තාක්ෂණික හැකියාව, ගෘහ නිර්මාණ වැනි තොරතුරු ද දැනගත හැක. එමෙන් ම චිත්‍ර හා මූර්ති මගින් කලා කුසලතාව වර්ණ භාවිතය, ඇඳුම් පැළඳුම් ආභරණ පැළඳීම වැනි කරුණු දැනගත හැකිය.
* සාහිත්‍ය මූලාශ්‍රවල තොරතුරු සනාථ කර ගැනීමට

  උදා : දසමහා යෝධයන්, පිළිබඳ මහාවංශයේ සඳහන් තොරතුරු සිතුල්පව්ව හා සංඛපාල විහාර ලිපි වැනි ලිපි මගින් තහවුරු වීම.

(03) (i) වල් දෙල් කැලෑකෙසෙල් ගෝනල කටුඅල

(ii) ඉබ්බන්කටුව, ගල්සොහොන්කන්න යටිගල්පොත්ත, වෛරගල, හල්දුම්මුල්ල පොම්පරිප්පු

(iii) වාර්ෂික වර්ෂාපතනය, ජලවහනය, භූ විෂමතාවය, පසේ ස්වභාවය,

ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය යන කරුණු අතරින් 2 ක් පිළිබඳ විස්තර කිරීම.

මැටිඔරු සුසාන, නිවාස ඉදි කිරීම, මැටි වළං සෑදීම

10 ශ්‍රේණිය පෙළපොත 63 - 64 පිටු

(04) (i)
* කෘෂිකර්මාන්තය සඳහා
* ගංවතුර පාලනය
* නාගරික ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සඳහා

(ii)
* වැව් පද්ධතියක් පාලනය කිරීම
* ගම් කිහිපයක ජීවත් වූ වැඩියන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් තීරණ ගැනීමේ බලයක් පැවරී තිබුණ නිසා.

(iii) දේවානම්පියතිස්ස රජු

ඉන්දියාවේ අශෝක රජතුමා සමග පැවති සුහද සබඳතා හේතුවෙන් ලංකාවට ස්ථිර ආගමක් ලෙස බුදුදහම ලැබීම. ශ්‍රී මහා බෝධීන් වහන්සේ 18 කුලයක ශිල්ප ශ්‍රේණීන්ගේ පැමිණීම රාජාභිෂේකය සඳහා රාජකකුධ භාණ්ඩ ලබා දීම දෙවන පිය විරුදය හිමිවීම.

I විජයබාහු රජු

දේශපාලනමය වශයෙන් ස්ථාරත්වයන් ගොඩනගා ගැනීම සඳහා තම නැගණිය වූ මිත්ත කුමරිය පාණ්ඩ්‍ය කුමාරයකුට විවා කරදීම, එමෙන් ම කාලිංග දේශයෙන් විවාහය සඳහා තිලෝකසුන්දරී බිසව ගෙන්වා ගැනීම, වීශ්නසනීයත්වය වර්ධනයක් ගැනීම සඳහා පොළොන්නරුවේ ඉදිකළ දළදා මාළිගාවේ ආරක්ෂාව ඉන්දියාවේ වේලක්කර හමුදාවට බාරදීම.

(iv) ගොවිතැන හේන් ගොවිතැන

මඩ ගොවිතැන

සත්ව පාලනය

ඉහත කරුණු සම්බන්ධයෙන් කරුණු විස්තරාත්මකව දැක්වීම සඳහා ලකුණු පිරිනැමීම.

(05) (i) කෝට්ටේ, යාපනය, උඩරට

(ii)
★ සීතාවක රාජසිංහ රජු අවසන් කාලයේ අනුගමනය කළ බෞද්ධ විරෝධි ප්‍රතිපත්ති
★ වීරසුන්දර බණ්ඩාර මැරවීම
★ වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර උඩරට රජ වීම.
★ රාජසිංහ රජුගෙන් පසු රාජධානියට නිසි උරුමකරුවෙක් නොසිටීම.

  යන කරුණු අතරින් 2 ක්

(iii) ★ විජයබා කොල්ලයෙන් පසු රාජධානිය කෝට්ටේ, සීතාවක, රයිගම ලෙස කොටස්වලට වෙන් වීම.

(iv)
* බුවනෙකබාහු රජුගෙන් පසු රාජ්‍ය උරුමය කුඩා ධර්මපාලට පැවරීම
* ධර්මපාල කුමරි පෘතුග්‍රිසි ග්‍රහණයට ගනු ලැබූ අතරි ඔහු පෘතුග්‍රීසින්ගේ රූකඩ පාලකයෙක් බවට පත් වීම.
* උඩරට රාජධානියේ ස්වභාවික රැකවරණය ගිරිදුර්ග, වනදුර්ග ජලදුර්ග පැවතීම ආක්‍රමණ දියත් කිරීම
* උදා: මහවැලි ගංගාව, බලන හුන්න ස්ගිරිය වැනි දුර්ග මාර්ග, හන්තාන උඩවත්ත වැනි කඳු පමණි.
* උඩරට ජනතාව හැමවිටම රජුට සහය වීම.
* උඩරැටියන්ගේ සටන් උපක්‍රම රජවරුන්ගේ උපාය කෞශල්‍යා හා දක්ෂ රජවරුන් එකල උඩරට බලයට පත් වීම. උදා : I විමලධර්මසූරිය, II රාජසිංහ

(06) (i) ජෝන් ෆයිබස්, හියු බොයිඩ්, රොබට් ඇන්ඩෲස්

(ii) බදු එකතු කිරීමට යොදවා සිටි මදුරාසි නිලධාරින් ආපසු යවා ඒ සඳහා දේශීය නිලධාරින් යොදවා ගැනීම.

* පොල්ගස් බද්ද ඇතුළු අලුත් බදු වර්ග ඉවත් කිරීම.
* ආදායම් එකතු කිරීම හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිලධාරින් පත් කිරීම
* ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටු වීම.

මෙම කරුණු අතරින් 2 ක්

(iii) 1. උඩරට රාජධානිය ස්වාධීන රාජ්‍යයක් ලෙස නැවතීම ඉංග්‍රීසින්ගේ කටයුතුවලට බාධාවක් වීම.

ඉංග්‍රීසින්ගේ පාලන මධ්‍යස්ථානය කොළඹ හා නාවික මධ්‍යස්ථානය අතර සබඳතා පැවැත්විය යුතු වූ අතර කෙටීම මාර්ගය උඩරට හරහා යා යුතු විය. එවැනි අවස්ථාවල ද ඇතැම් විට උඩරට රජු උඩරටට ඇනිලුවීඹය තිබූ කඩවන් වසා දීම, බදු අය කිරීම, උඩරට හරහා මාර්ගයක් සෑදීමට අවසර ඉල්ලුව ද ඒ සඳහා අවසර ලබා නොදීම ආදී විස්තරයක්

2. පහතරට වැසියන් තවදුරටත් ඔවුන්ගේ රජු ලෙස උඩරට රජු පිළිගැනීම

එම තත්ත්වයන් ප්‍රයෝජනයට ගනු ලැබූ උඩරට රජු පහතරට වැසියන් ඉංග්‍රීසි පාලනයට විරුද්ධව කැරලි කෝලාහල ආදිය ඇති කිරීම සඳහා පෙළඹ වීම ඒවාට නායකත්වය දීම ආදිය.

3. මුහුදු මාර්ගය භාවිතා කිරීමේ දී විශාල වශයෙන් පාඩු විඳීමට සිදු වීම ආදි කරුණු විස්තර කිරීමට අදාලව ලකුණු පිරිනමන්න.

(iv) 1. ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය
2. ගම්සභාව අඩපණ වීම
3. නව අධිකරණ ක්‍රමය
4. රජය හා මහජනතාව අතර සබඳතාව දුරස් වීම

ඉහත කරුණුවලින් 3 ක් විස්තර කර තිබීම. 11 ශ්‍රේණිය පෙළපොත පිටුව 39 - 40

(07) (i) ලන්ඩන්, වර්ච්, වෙස්ලියන්, ඇමරිකන්, බැප්ටිස්ට් යන ඒවායින් 3 ක්

(ii)
* ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සාමාජික පිරිස ඉහළ දැමීම.
* වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම
* පළාත්බද නියෝජ්‍ය ක්‍රමය අනුව ඒ ඒ පළාත් වෙනුවෙන් ඡන්ද බලයෙන් නියෝජිතයන් තෝරා ගැනීමට ඉඩ සැලසීම.
* ව්‍යවස්ථාදායක සභාවේ බලතල වැඩි කිරීම යන කරුණු 4 න් 2ක්

(iii)
* සර්ව ජන ඡන්දබලය හඳුන්වා දීම
* රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටු වීම.
* විධායක කාරක සභා ක්‍රමයක් හඳුන්වා දීම
* රාජ්‍ය නිලධාරින් තිදෙනෙකු පත් කිරීම

විස්තර 11 ශ්‍රේණියේ 63 - 64 පිටු

(iv) හිතකර

* ගමනාගමනය හා සන්නිවේදන කටයුතු දියුණු වීම.
* අපනයන වැවිලි භෝග හඳුන්වා දීම
* ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂා දැනුම රට තුළ පැතිරීම.

අහිතකර

* මධ්‍යසාර භාවිතය රටපුරා ව්‍යාප්ත වීම.
* ඉඩම් අහිමි ජනතාවක් බිහි වීම
* ගම්සභාව වැනි ප්‍රයෝජනවත් අංග විනාශ වීම.

## III කොටස

(08) (i) සාහිත්‍ය, ඉතකිහාසය, නාට්‍ය, ශබ්ද විද්‍යාව

(ii)
* මාලිමා යන්ත්‍රය, උතුරු මාපකය වැනි උපකරණ නිපදවීම.
* ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම.
* ටොලමි විසින් ලෝක සිතියම නිර්මාණය කිරීම
* ජාතික රාජ්‍යයන් මෙම ගමන් සඳහා අනුග්‍රහ දක් වීම.

(iii)
1. ජාතික රාජ්‍ය බිහි වීම.
2. මධ්‍යම පන්තියක් බිහි වීම.

ඒ පිළිබඳ විස්තර කිරීමට ලකුණු ලබා දෙන්න. 10 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොත 122 පිටුව.

(iv)
1. බුද්ධි ප්‍රබෝධය
2. වෙළඳාම දියුණු වීම හා ධනවතුන් බිහි වීම.
3. කොන්ස්තන්තිනෝපලය තුර්කින් යටතට පත් වීම.
4. පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම.

විස්තර 10 ශ්‍රේණිය 117 - 118 පිටු

(09) (i) දුවන නඩාව, මියුල් යන්ත්‍රය, ජලරාමුව, පෙනි යන්ත්‍රය

(ii)
A - හෙන්රි බෙල්
B - සැමුවෙල් මෝස්
C - ජෙන් රෝටර්
D - රොබට් බැක්වෙල්

(iii)
★ පන්ති සමාජයක් බිහි වීම.
★ වැඩ කරන ජනතාවගේ ජීවන තත්වය අසතුටුදායක වීම.
★ මිනිසුන්ගේ ජීවන තත්වය වැඩි දියුණු වීම.

11 පෙළපොත 15 පිටුව

(iv) කර්මාන්ත
- පෙඩ්රික් නෝර්ත් කෝපි කෙටීමට මෝලස් ඇරඹීම
- තේ වියලීම සිට වර්ග කිරීම සහ අපනයනය දක්වා බොහෝ කාර්යයන් යන්ත්‍ර මගින් කිරීම
- රබර් පිටරට යැවීම සුදානම් කිරීම යන්ත්‍ර භාවිතය

ප්‍රවාහන
- මැකලම් ක්‍රමය හඳුන්වා දීම.
- ඒ අනුව එඩ්වන් බාන්ස් ආණ්ඩුකාරයාගේ කාලයේ කොළඹ - මහනුවර මාර්ගය ඉදි කිරීම
- හෙන්රි වෝඩ් ආණ්ඩුකාරයා දුම්රිය මාර්ග තැනීම ආරම්භ කළ අතර කොළඹ සිට මහනුවර දක්වාත් ඉන්පසු දුම්රිය මාර්ග ව්‍යාප්ත වූ ආකාරය දක්විය යුතුය.
- දැව පාලම් වෙනුවට යකඩ පාලම් ඉදි කරවීම.

සන්නිවේදනය
- කොළඹ, ත්‍රිකුණාමලය, ගාල්ල, යාපනය නගර සම්බන්ධ කරගනිමින් රාජකාරි තැපැල් සේවයක් ඇරඹීම
- ආසියාවේ ප්‍රථම වරට අශ්ව කරත්ත ධාවනය මගින් තැපැල් සේවා ඇරඹීම.
- රටේ විවිධ ස්ථාන ආවරණ වන ලෙස තැපැල් කාර්යාල 340 ක් අරඹීම ආදි කරුණු දක්වා තිබීම.